SRI LANKA

**ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය**

# අදියර I විභාගය - 2024 ජුලි

# යෝජිත උත්තර

# (104) ව්‍යාපාරික පරිසරය (BEN)

ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය
නො. 540, පූජ්‍ය මුරුත්තෙට්ටුවේ ආනන්ද නාහිමි මාවත,
නාරාහේන්පිට, කොළඹ 05.
දුරකථන: 011-2-559 669

**මෙය අධ්‍යාපන හා පුහුණු කිරීම් අංශයේ ප්‍රකාශනයකි**

ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

අදියර I විභාගය - 2024 ජුලි

(104) ව්‍යාපාරික පරිසරය

# යෝජිත උත්තර

අනිවාර්ය ප්‍රශ්න 20 කි
(මුළු ලකුණු 40)

**A** කොටස

*පළමුවන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තරː*

**1.1** (2)

**1.2** (2)

**1.3** (4)

**1.4** (4)

**1.5** (2)

**1.6** (1)

**1.7** (3)

**1.8** (1)

***1.9*** (2)

**1.10** (3)

***(එකකට ලකුණු දෙක (02) බැගින් මුළු ලකුණු 20 කි)***

**1.11** සත්‍ය

**1.12** සත්‍ය

**1.13** අසත්‍ය

**1.14** අසත්‍ය

**1.15** සත්‍ය

***(එකකට ලකුණු දෙක (02) බැගින් මුළු ලකුණු 10 කි)***

**1.16.** **පහත සඳහන් ඕනෑම වාසි දෙකක් සඳහන් කිරීමෙන් සම්පූර්ණ ලකුණු ලබා ගත හැකිය.**

1. වෙළඳපල ප්‍රවේශයට පහසුකම් සැලසීම
2. බෙදාහැරීමේ කාර්යක්ෂමතාව
3. අතිරේක සේවාවන් සැපයීම
4. ව්‍යාපාරයේ කාර්යයන් සහ වගකීම් අඩු කරයි
5. සැපයුම් දාමය වේගවත් කිරීම
6. වෙළඳපොළ ප්‍රවේශය වැඩි කිරීම
7. පිරිවැය ඵලදායී වීම
8. ඵලදායිතාව වැඩි දියුණු කිරීම
9. විකුණුම් වැඩි කිරීම
10. කාලය ඉතිරි වීම
11. පාරිභෝගික සේවය වැඩිදියුණු වීම

***(ලකුණු 02 යි)***

**1.17.**

හරිත ව්‍යවසායකත්වය යනු පාරිසරික ගැටළු සහ සමාජීය ගැටළු හෝ අවශ්‍යතා පිළිබඳව දැනුවත් කිරීම සහ ස්වභාවික පරිසරය කෙරෙහි ධනාත්මක බලපෑමක් ඇති කිරීම කෙරෙහි අවධානය යොමු කරන ව්‍යවසායකත්ව ක්‍රියාකාරකමකි.

<u>විකල්ප පිළිතුර</u>

හරිත ව්‍යවසායකත්වය යනු ආර්ථික සාර්ථකත්වය සහ ධනාත්මක පාරිසරික බලපෑමක් යන දෙකම ඉලක්ක කර ගනිමින් පරිසර හිතකාමී නිෂ්පාදන හෝ සේවා පිරිනැමීම, පාරිසරික තිරසාරත්වයට ප්‍රමුඛත්වය දෙන ව්‍යාපාර ගොඩනැගීමේ ක්‍රියාකාරකමකි.

aat SRI LANKA

***(ලකුණු 02 යි)***

**1.18.** **පහත වෙනස්කම් දෙකෙන් ඕනෑම එකක් සඳහන් කිරීමෙන් සම්පූර්ණ ලකුණු ලබා ගත හැකිය.**

| ලක්ෂණ | මුදල් වෙළෙඳපොළ | ප්‍රාග්ධන වෙළෙඳපොළ |
|---|---|---|
| අරමුදල්වල කාලසීමාව | වසරකට වඩා අඩු කාලසීමාවක් ඇති ණය මුදල් පිළිබඳ කටයුතු කරයි. | වසරකට වඩා වැඩි කාලසීමාවක් ඇති දිගුකාලීන අරමුදල් පිළිබඳව කටයුතු කරයි. |
| මුදල් සැපයුම | සමාගම්වල ව්‍යාපාර මෙහෙයුම් කටයුතුවලට අදාළ කාරක ප්‍රාග්ධන අවශ්‍යතා හා රජයේ කෙටි කාලීන මූල්‍ය අවශ්‍යතා මූල්‍යනය කිරීමට අරමුදල් සපයයි. | වෙළෙඳ හා වාණිජ කටයුතු වලට අදාළ ස්ථාවර ප්‍රාග්ධන අවශ්‍යතා හා රජයේ දිගුකාලීන අරමුදල් අවශ්‍යතා මූල්‍යනය කිරීම පිළිබඳව කටයුතු කරයි. |

| | | |
|---|---|---|
| භාවිත වන සුරැකුම්පත් | එය වාණිජ බිල්පත් (විනිමය බිල්පත්, භාණ්ඩාගාර බිල්පත්, වාණිජ පත්‍රිකා ආදිය) වැනි උපකරණ සමග කටයුතු කරයි. | එය කොටස්, ණයකර, රජයේ බැඳුම්කර වැනි උපකරණ සමග ගනුදෙනු කරයි. |
| ප්‍රධාන ආයතනවල කාර්යයභාරය | මුදල් වෙළෙඳපොළ සම්බන්ධව ප්‍රධාන ආයතන වනුයේ මහ බැංකුව හා වාණිජ්‍ය බැංකු ය. | සංවර්ධන බැංකු හා රක්ෂණ සමාගම් ප්‍රාග්ධන වෙළෙඳපොළ තුළ ප්‍රමුඛ කාර්යභාරයක් ඉටු කරයි |
| සුරැකුම්පත්වල සුලභතාව | මුදල් වෙළෙඳපොළ තුළ හුවමාරු වන සුරැකුම්පත්වලට අදාලව සාමාන්‍යයෙන් ද්විතීයික වෙළෙඳපොළක් නොමැත. | ප්‍රාග්ධන වෙළෙඳපොළ තුළ හුවමාරු වන සුරැකුම්පත් සම්බන්ධව ද්විතියික වෙළෙඳපොළක් පවතී. |
| බණ්ඩනය කිරීම | මුදල් වෙළෙඳපොළ තුළ බණ්ඩනය කිරීමක් නොමැත | ප්‍රාථමික වෙළෙඳපොළ හා ද්විතියික වෙළෙඳපොළ ලෙස බණ්ඩනයන් පවතී |
| ගණුදෙනු වන ස්ථානය | ගනුදෙනු බොහෝ දුරට දුරකථනය හරහා සිදු වන අතර විධිමත් ස්ථානයක් නොමැත. | ගනුදෙනු විධිමත් ස්ථානයක සිදු වේ. උදා. කොටස් හුවමාරුව |

***(ලකුණු 02 යි)***

**1.19. පහත සඳහන් ඕනෑම දෙකක් සඳහන් කිරීමෙන් සම්පූර්ණ ලකුණු ලබා ගත හැකිය.**

- ගිණුමේ මුදල් නොමැති වීම
- අණකරුගේ අත්සන නොගැළපීම
- අණකරු විසින් ගෙවීම් නවතා ඇති විට
- චෙක්පත නිසියාකාරව ලියා නොමැති විට
- ගිණුම වසා ඇති විට
- චෙක්පත බොඳවී හෝ අපහැදිලි වී ඇති විට

***(ලකුණු 02 යි)***

aat SRI LANKA

**1.20.** **පහත සඳහන් ඕනෑම දෙකක් සඳහන් කිරීමෙන් සම්පූර්ණ ලකුණු ලබා ගත හැකිය.**

| ව්‍යවසායකයා | කළමනාකරු |
|---|---|
| ව්‍යාපාරයක් ආරම්භ කිරීමට මූලිකව කටයුතු කරයි | ඇරඹූ ව්‍යාපාරය පවත්වාගෙන යයි |
| අවදානම් දරණ ව්‍යවසායකයා ඒ වෙනුවෙන් ලාභ හෝ පාඩු අත් විඳී | කළමනාකරුවා ව්‍යාපාර කටයුතු මනා ලෙස කරගෙන යාමට තම හැකියාව මෙහෙයවයි |
| ව්‍යවසායකයා ව්‍යාපාරයේ අයිතිකරු වේ | කළමනාකරුවා ව්‍යාපාරයේ සේවකයෙකු වේ |
| ව්‍යවසායකයා ව්‍යාපාරය වෙනුවෙන් සමාජයට, රජයට වගකිව යුතු වේ | කළමනාකරුවා තම කටයුතු වෙනුවෙන් අයිතිකරුට වගකිව යුතුය |
| බලය තමන් විසින් නිර්මාණය කර ගනී | තනතුර මත අධිකාරී බලය ලැබේ |
| ව්‍යාපාරික අවස්ථා හඳුනා ගනී | ව්‍යාපාරික ගැටළු හඳුනා ගනී |
| සමාජ ප්‍රතිලාභ කෙරෙහිද සමාජ වගකීම් කෙරෙහිද අවධානය යොමු කරයි | ව්‍යාපාරයේ ප්‍රතිලාභ කෙරෙහි අවධානය යොමු කරයි |

***(ලකුණු 02 යි)***

***(මුළු ලකුණු 40 යි)***

SRI LANKA

***A කොටසෙහි අවසානය***

(මුළු ලකුණු 40 යි) **B කොටස**

## දෙවන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තරඃ

*පරිච්ඡේදය - ව්‍යාපාර සංවිධාන*

**(a) පහත සඳහන් ඕනෑම දෙකක් සඳහන් කිරීමෙන් සම්පූර්ණ ලකුණු ලබා ගත හැකිය.**

1 සීමාරහිත සමාගම්

2 වගකීම් වලින් සීමා වූ සමාගම්

3 පොදු සමාගම්

4 අක්වෙරළ සමාගම්

5 ලැයිස්තුගත සමාගම්

*(ලකුණු 02 යි)*

**(b)**

| ලක්ෂණ | කේවල ස්වාමි ව්‍යාපාරය | වගකීමෙන් සීමිත සමාගම් |
|---|---|---|
| **නීතිමය පුද්ගලභාවය** | නීතිමය පුද්ගලභාවයක් නොමැත. නීතිය ඉදිරියේ අයිතිකරු සහ ව්‍යාපාරය එකිනෙකට සමාන වේ | නීතිමය පුද්ගලභාවයක් ඇත. නීතිය ඉදිරියේ අයිතිකරු සහ ව්‍යාපාරය එකිනෙකට වෙනස් වේ |
| **පාලනය** | අයිතිකරු විසින් පාලනය කරයි | පාලනය කොටස් හිමියන්ගේ සාමූහික පාලනයට සහ ව්‍යවස්ථාපිත පාලනයට යටත් වේ |
| **අඛණ්ඩ පැවැත්ම** | අඛණ්ඩ පැවැත්මක් නැත. අයිතිකරුගේ මිය යාමෙන් පසුව ව්‍යාපාරය නොපවතී | අඛණ්ඩ පැවැත්මක් ඇත. හිමිකරුගේ පැවැත්ම ව්‍යාපාරයේ පැවැත්මට බලපාන්නේ නැත |
| **ගිණුම්කරණය සහ විගණනය** | අනිවාර්ය නොවේ | අනිවාර්ය වේ |

*(ලකුණු 04 යි)*

**(c) පහත සඳහන් වාසි සහ අවාසිවලින් ඕනෑම දෙකක් (එකකින් දෙකක්) සඳහන් කිරීමෙන් සම්පූර්ණ ලකුණු ලබා ගත හැකිය.**

**සීමාසහිත පුද්ගලික සමාගමක වාසි**

- අයිතිය පවුලේ ඥාතීන් හිතවතුන් අතරේ පවත්වාගෙන යා හැකි වීම
- සමාගමේ පාලන බලය සීමිත පිරිසක් අතරේ රඳවා ගැනීමට හැකි වීම
- ලාභය සීමිත පිරිසක් අතරේ බෙදා ගැනීමට හැකි වීම
- වැඩි ප්‍රාග්ධනයක් රැස්කරගත හැකි වීම
- වගකීම සීමිත වීම

- නීතිමය පුද්ගලභාවයක් පැවතීම
- පොදු සමාගම්වලට සාපේක්ෂව නීතිමය බලපෑම අඩුවීම
- අඛණ්ඩ පැවැත්මක් හිමි වීම
- අධ්‍යක්ෂක මණ්ඩලය මගින් කළමනාකරණය නිසා කළමනාකරණය කාර්යක්ෂම වීම
- කොටස්කරුවන් සියලු දෙනාගේ ඒකමතික යෝජනා සම්මතයකින් රැස්වීම් පැවැත්වීමෙන් තොරව සමාගමේ බොහෝ කටයුතු ඉටු කිරීමේ හැකියාව ලැබීම
- ණය ගෙවීමේ හැකියාව පිළිබඳව පරීක්ෂණයකින් තොරව කොටස් හිමියන් වෙත ලාභාංශ බෙදා හැරීමට හැකිවීම
- විවිධ බදු සහන ලැබීමේ හැකියාව

**සීමාසහිත පුද්ගලික සමාගමක අවාසි**

- පොදු සමාගම්වලට සාපේක්ෂව අඩු ප්‍රාග්ධන සම්පාදනයක් සිදු වේ
- කොටස් වෙළඳපොළේ ලේඛණගත විය නොහැකි වීම
- කොටස් නිදහසේ පැවරීම කළ නොහැකි වීම
- සමාගම් පනතේ නීතිමය අවශ්‍යතා ඉටුකළ යුතු වීම
- සංස්ථාපනය කිරීම සංකීර්ණ වීම හා ඉහළ පිරිවැයක් දැරීමට සිදු වීම
- පරිපාලන වියදම් අධික වීම

*(ලකුණු 04 යි)*

*(මුළු ලකුණු 10 යි)*

## *තුන්වන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තරය*

| *පරිච්ඡේදය 03 - ව්‍යාපාර සඳහා වූ උපකාරක සේවා - මුදල් හා බැංකු* |
|---|

**(a)**

මුදල් යනු රටේ මුදල් අධිකාරිය (ශ්‍රී ලංකා මහ බැංකුව) විසින් එහි ප්‍රධාන මුදල් ඒකකය ලෙස නිකුත් කරන ලද කාසි සහ නෝට්ටු වේ. මේවා ව්‍යවස්ථාපිත, වලංගු මුදල් හෝ වරලත් මුදල් ලෙස හැඳින්වේ.

**<u>විකල්ප පිළිතුර</u>**

මුදල් යනු යම් රටක් හෝ ආර්ථික කලාපයක් තුළ සාමාන්‍ය භාවිතයේ පවතින මුදල් පද්ධතියයි, සාමාන්‍යයෙන් රජයක් හෝ මහ බැංකුවක් විසින් නිකුත් කරන ලද කඩදාසි නෝට්ටු සහ කාසිවලින් සමන්විත වන අතර එය භාණ්ඩ හා සේවා සඳහා හුවමාරු මාධ්‍යයක් ලෙස භාවිත කරයි.

*(ලකුණු 02 යි)*

**(b) පහත සඳහන් ඕනෑම හතරක් සඳහන් කිරීමෙන් සම්පූර්ණ ලකුණු ලබා ගත හැකිය.**

- දිනය නිවැරදිව සඳහන් කිරීම
- චෙක්පතෙහි ආදායකයාගේ නම නිවැරදිව සඳහන් කිරීම
- මුදල නිවැරදිව ඉලක්කමෙන් සහ අකුරින් සඳහන් කිරීම
- අණකරුගේ අත්සන නියම ආකාරයෙන් යොදා ගැනීම
- වෙනස්කිරීම්වලින් වැළකීම
- පිළිපතෙහි අදාල විස්තර සටහන් කර ගැනීම
- එකම භාෂා මාධ්‍යයක් යොදා ගැනීම
- පහසුවෙන් මැකිය නොහැකි තීන්ත වර්ගයක් භාවිතා කිරීම

***(ලකුණු 04 යි)***

**(c) පහත සඳහන් ඕනෑම දෙකක් පැහැදිලි කිරීමෙන් සම්පූර්ණ ලකුණු ලබා ගත හැකිය.**

**1 වැඩි දියුණු කළ නම්‍යශීලීභාවය සහ පහසුව** - විද්‍යුත් උපකරණ හරහා ඕනෑම වේලාවක සහ ඕනෑම තැනකට ප්‍රවේශ විය හැකි, භෞතික මුදල් රැගෙන යාමේ අවශ්‍යතාවයකින් තොරව ඉක්මන් සහ පහසු ගනුදෙනු සඳහා විද්‍යුත් මුදල් ඉඩ ලබා දේ.

**2 වැඩි දියුණු කළ ආරක්ෂාව** - විද්‍යුත් මුදල් ගනුදෙනු සාමාන්‍යයෙන් සංකේතනය කර සුරක්ෂිත කර ඇති අතර, භෞතික මුදල් හැසිරවීම හා සසඳන විට සොරකම්, අලාභ හෝ වංචා අවදානම අඩු කරයි.

**3 ඉතිහාස වාර්තා** - විද්‍යුත් මුදල් භාවිතය වැඩි වැඩියෙන් ජනප්‍රිය වෙමින් පවතින්නේ එය සිදු කරන සෑම ගනුදෙනුවකදීම ප්‍රබල ඩිජිටල් වාර්තාවක් ඇති බැවිනි.

**4 වංචනික ක්‍රියාකාරකම් අඩු කිරීම** - විද්‍යුත් මුදල් මඟින් සිදු කරන ලද සෑම ගනුදෙනුවකටම සවිස්තරාත්මක ඓතිහාසික වාර්තා ලබා දෙන බැවින් ගනුදෙනු පිළිබඳ වාර්තාවක් තබා ගැනීම සහ ආර්ථිකය හරහා ඒවා නැවත සොයා ගැනීම ඉතා පහසුය. එය ආරක්ෂාව වැඩි කරන අතර වංචනික ක්‍රියාකාරකම් අඩු කිරීමට උපකාරී වේ.

**5 කාලය සහ සම්පත් ඉතිරි වීම** - විද්‍යුත් මුදල් භාවිත කිරීමට ප්‍රධාන හේතුව එය කාලය සහ සම්පත් අඩු කිරීමයි. ඕනෑම තැනක ගනුදෙනු කළ හැකිය.

**6 ජීවන රටාව** - නවීන තාක්ෂණය ජීවන රටාව වෙනස් කරයි, එහිදී මිනිසුන් නවීන ප්‍රවණතා භාවිතා කිරීම දියුණු ජීවන රටාවක් ලෙස සලකයි. විද්‍යුත් මුදල් ද පරිශීලකයින් විසින් ඒ ආකාරයෙන්ම වටහාගෙන ඇත.

**7 පිළිගැනීම** - ලොව පුරා බොහෝ ව්‍යාපාර විසින් විද්‍යුත් මුදල් වැඩි දියුණු කළ භාවිතය සක්‍රීය කරයි.

***(ලකුණු 04 යි)***

***(මුළු ලකුණු 10 යි)***

aat SRI LANKA

## *හතරවන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තරඃ*

| |
|---|
| *පරිච්ඡේදය 05 - ව්‍යාපාර කෙරෙහි රජයේ බලපෑම*<br>*පරිච්ඡේදය 07 - කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර* |

**(a) පහත සඳහන් ඕනෑම තුනක් සඳහන් කිරීමෙන් සම්පූර්ණ ලකුණු ලබා ගත හැකිය.**

- ආර්ථික වර්ධනය හා සංවර්ධනය
- පූර්ණ සේවා නියුක්තියක් බිහි කිරීම
- ආර්ථික ස්ථායිතාවය ඇති කිරීම
- සාධාරණ ආදායම් ව්‍යාප්තියක් ඇති කිරීම
- යහපත් අන්තර්ජාතික වෙළඳාමක් පවත්වා ගෙන යාම
- තිරසර සංවර්ධනය

*(ලකුණු 03 යි)*

**(b)**

- **පාරිසරික වගකීම** - පරිසර හිතකාමී මුද්‍රණ පිළිවෙත් අනුගමනය කිරීම සහ අපද්‍රව්‍ය අවම කිරීම මගින් ඔවුන්ගේ මෙහෙයුම්වල පාරිසරික බලපෑම අවම කිරීම.
- **සදාචාරාත්මක ව්‍යාපාර පිළිවෙත්** - විනිවිදභාවයෙන් හා සාධාරණව ක්‍රියාත්මක වීම, ගනුදෙනුකරුවන්, සැපයුම්කරුවන් සහ සේවකයන් සමග අවංක ගනුදෙනු සහතික කිරීම.
- **ප්‍රජා සහභාගීත්වය** - රැකියා අවස්ථා, වගකිවයුතු සම්පත් භාවිතය සහ සමාජ මුලපිරීම්වලට සහභාගී වීම තුළින් ප්‍රාදේශීය ප්‍රජාවන්ට සහාය වීම.

*(ලකුණු 03 යි)*

**(c) පහත හේතුවලින් ඕනෑම දෙකක් සඳහන් කිරීමෙන් සම්පූර්ණ ලකුණු ලබා ගත හැකිය.**

**1 කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර රටේ දළ දේශීය නිෂ්පාදිතයට දායක වේ.**

ලෝක බැංකු වාර්තාවට අනුව විධිමත් කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර නැගී එන ආර්ථිකයන්හි ජාතික ආදායමෙන් (දළ දේශීය නිශ්පාදිතයෙන් 40%) ක් දක්වා දායක වේ.
අවිධිමත් කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ඇතුලත් කළ විට මෙම ප්‍රතිශතය සැලකිය යුතු ලෙස වැඩිය. ශ්‍රී ලංකාවේ දළ දේශිය නිශ්පාදිතයෙන් (52%) කට ආසන්න ප්‍රමාණයක් කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර වේ. එය අනෙකුත් දකුණු ආසියානු හා ගිනිකොණ දිග ආසියානු රටවලට සාපේක්ෂව ඉහළ අගයකි.

**2 රැකියා අවස්ථා නිර්මාණය කිරීම**

රැකියා අවස්ථා උත්පාදනය කුඩා මධ්‍යම ව්‍යවසායකයන්ගේ එක් ප්‍රතිලාභයක් වන අතර සංවර්ධිත සහ සංවර්ධනය වෙමින් පවතින රටවල SME & විසින් නිර්මාණය කරන ලද රැකියා සමස්ත රැකියා වලින් විශාල කොටසකි. ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව (2017) විසින් සිදු කරන ලද කාර්මික සමීක්ෂණයට අනුව ශ්‍රී ලංකාවේ කුඩා මධ්‍ය පරිමාණ ව්‍යවසාය විසින් නිර්මාණය කරන ලද රැකියාවලින් (45%) කි.

**3 දේශීය ආයෝජනයන් වර්ධනය වීම හා ඉතුරුම් ඒකරාශී වීම**

කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර හේතුවෙන් ඉතුරුම් ආයෝජනයන් බවට පරිවර්තනය වීම සිදු වේ.

**4 දුප්පත්කම තුරන් කිරීම**

කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර හේතුවෙන් පුද්ගල ආදායම් ඉහළ යාම හේතුවෙන් දිළිඳුකම අඩු වීම සිදු වේ.

**5 සාධාරණ ආදායම් ව්‍යාප්තියක් ඇති කිරීමට හේතුවීම**

කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර රැකියා උත්පාදනය සඳහා දායක වේ. විශේෂයෙන් අර්ධ නිපුණතා හා නුපුහුණු ශ්‍රමය යොදාගනිමින් ව්‍යාපාර කටයුතු සිදු කරන බැවින් සමාජයේ අඩු ආදයම්ලාභී පාර්ශවයන්ගේ ආදායම් ඉහළ යාමෙන් ආදායම් බෙදීයාමේ විෂමතාවයන් ඉවත් කළ හැකි වේ.

**6 කලාපීය සංවර්ධනයට දායක වීම**

රැකියා උත්පාදනය කිරීම, දරිද්‍රතාවය තුරන් කිරීම, ආයෝජනයන් ඉහළ යාම ආදිය තුළින් කාලාපීය රටවල් අතර ඇති වන ආර්ථික වර්ධනයයි.

**7 ආර්ථිකයන්හි නම්‍යශීලී බව හා නව වෙනස්වීම් වලට අනුවර්ථනය වීමේ හැකියාව වර්ධනය වීම**

කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවල එක් සුවිශේෂී ලක්ෂණයක් වන්නේ ඒවායේ නම්‍යතාවයයි. මෙම ව්‍යාපාරවල වෙනස් කිරීමට පහසු සරල කළමනාකරණ ව්‍යුහයක් පවතින බැවින් ඉතා ඉක්මණින් පරිසර වෙනස්වීම්වලට අනුවර්තනය වීමට මෙම ව්‍යාපාරවලට හැකියාව පවතී.

***(ලකුණු 04 යි)***
***(මුළු ලකුණු 10 යි)***

## *පස්වන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තර:*

aat SRI LANKA

**පරිච්ඡේදය 04 - ව්‍යාපාර සංවිධානවල වෙළෙඳාම**
**පරිච්ඡේදය 05 - ව්‍යාපාර කෙරෙහි රජයේ බලපෑම ව්‍යාපාර ආචාර ධර්මවල ඇති වැදගත්කම**
**පරිච්ඡේදය 07 - ව්‍යවසායකත්වය**

**(a) පහත ඇති ඕනෑම වෙනස්කම් දෙකක් සඳහන් කිරීමෙන් සම්පූර්ණ ලකුණු ලබා ගත හැකිය.**

| ලක්ෂණ | තොග වෙළෙඳාම | සිල්ලර වෙළෙඳාම |
|---|---|---|
| සම්බන්ධ වන පාර්ශව | නිෂ්පාදකයා (විකුණුම්කරු) සහ තොග වෙළෙන්දා (ගැනුම්කරු) | සිල්ලර වෙළෙන්දා (විකුණුම්කරු) සහ පාරිභෝගිකයා (ගැනුම්කරු) |
| විකුණුම් ප්‍රමාණය | සාමාන්‍යයෙන් විශාල භාණ්ඩ ප්‍රමාණයක් ව්‍යාපාර / සිල්ලර වෙළෙන්දන්ට / වෙනත් තොග වෙළඳුන්ට විකුණනු ලැබේ. | සාමාන්‍යයෙන් කුඩා ප්‍රමාණයේ භාණ්ඩ සෘජුවම තනි පාරිභෝගිකයින්ට විකුණනු ලැබේ. |
| ගනුදෙනුකරුවන් වර්ගය | ව්‍යාපාරයකින් ව්‍යාපාරයකට සිදුවන ගනුදෙනු (B2B ගනුදෙනු) | ව්‍යාපාරයකින් තනි පාරිභෝගිකයින්ට සිදු වන ගනුදෙනු (B2C ගනුදෙනු) |

| | | |
|---|---|---|
| විකුණුම් සිදුවන ආකාරය | මෙයට සැලකිය යුතු මට්ටමේ ණය ගනුදෙනු ඇතුළත් වේ. | මෙම ගනුදෙනු මුදල් හා මුදල් සමාන මුදල් වලින් නිම වේ |
| ගනුදෙනු සිදුවන වාර ගණන | එකම පාර්ශවයන් අතර නැවත නැවතත් සිදු වේ. | එකම ගැනුම්කරුවන් සහ විකුණුම්කරුවන් නැවත හමු වීම අනිවාර්යයෙන් සිදු නොවේ. |
| වෙළෙඳ වට්ටම් | සැලකිය යුතු ලෙස භාවිතා වේ. | වැඩි වශයෙන් භාවිතා නොවේ. |

*(ලකුණු 02 යි)*

**(b) පහත බලපෑම්වලින් කවර හෝ දෙකක් පැහැදිලි කිරීමෙන් සම්පූර්ණ ලකුණු ලබාගත හැකිය.**

**1 අමු ද්‍රව්‍ය මිල උච්චාවචනය වීම**

දේශගුණික විපර්යාස ඉන්දුනීසියාවෙන් ආනයනය කරන ලද දුර්ලභ දැව ලබා ගැනීමේ හැකියාවට බාධා කරයි, එය තරුෂ් ගෘහ භාණ්ඩ සඳහා වියදම් වැඩි කිරීමට සහ මූල්‍ය අවිනිශ්චිතතාවයට හේතු වේ.

**2 සැපයුම් දාමයේ බාධාවන්**

පාරිසරික වෙනස්කම් නිසා ආනයනික දැව සැපයීමේ ප්‍රමාදයන් හෝ හිඟයන් ඇති විය හැකි අතර, නිෂ්පාදන කාලසටහන් වලට සහ පාරිභෝගික ඉල්ලුම නියමිත වේලාවට සපුරාලීමේ හැකියාවට බලපායි.

**3 නව වෙළෙඳපොළ සහ අවස්ථා නිර්මාණය කරයි**

විවිධ රටවල නව වෙළඳපල සහ අවස්ථා නිර්මාණය වන අතර මිනිසුන්ට එම වෙළඳපොළට ඇතුළු විය හැකිය.

**4 පුහුණු ශ්‍රමය සඳහා ප්‍රවේශය ලැබීම**

ගෝලීයකරණය ශ්‍රමයට ලොව පුරා ගමන් කිරීමට ඉඩ සලසයි. එබැවින් විවිධ රටවල දක්ෂ සේවකයින් සොයාගත හැකිය.

**5 ආර්ථික පිරිමැසුම්**

ගෝලීය ආර්ථිකයට යොමු වීමෙන් නිශ්පාදනයේදී මෙන්ම අලෙවියේදී ද ආර්ථික පිරිමැසුම් අත්කරගත හැකිය.

**6 නව තාක්ෂණය හා දැනුම සඳහා ප්‍රවේශය**

ගෝලීයකරණය හරහා සංවිධානයට නව තාක්ෂණයන් සහ දැනුම සඳහා වැඩි ප්‍රවේශයක් ලැබෙනු ඇත.

*(ලකුණු 04 යි)*

aat SRI LANKA

**(c) පහත බලපෑම්වලින් ඕනෑම හතරක් සඳහන් කිරීමෙන් සම්පූර්ණ ලකුණු ලබාගත හැකිය.**

- නවෝත්පාදනය
- අනුවර්තනය වීමේ හැකියාව / නම්‍යශීලී බව
- අවදානම ගැනීමට සහ කළමනාකරණය කිරීමට ඇති හැකියාව
- උපායමාර්ගික චින්තනය
- දැක්ම
- නිර්මාණශීලීත්වය
- ආත්ම විශ්වාසය
- නව ව්‍යාපාර අවස්ථා හඳුනා ගැනීමට හැකි වීම
- අභිප්‍රේරණය වී සිටීම
- තීරණාත්මක බව / වේගවත් තීරණ
- කැපවීම / වෙහෙස මහන්සි වී වැඩ කිරීම
- ස්වාධීනත්වය
- ජයග්‍රහණ දිශානතිය
- ශුභවාදී වීම

aat SRI LANKA

***(ලකුණු 04 යි)***

***(මුළු ලකුණු 10 යි)***

***B කොටසෙහි අවසානය***

(මුළු ලකුණු 20 යි)

**C කොටස**

## හයවන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තරඃ

| |
|---|
| **පරිච්ඡේදය 02 - ව්‍යාපාර පරිසරය සහ ව්‍යාපාර සංවිධාන කෙරෙහි එහි බලපෑම** |
| **පරිච්ඡේදය 03 (1) කොටස - ව්‍යාපාර සඳහා අවශ්‍ය උපකාරක සේවාඃ මුදල් හා බැංකු** |
| **පරිච්ඡේදය 03 (5) කොටස - ව්‍යාපාර සඳහා අවශ්‍ය උපකාරක සේවාඃ රක්ෂණය** |
| **පරිච්ඡේදය 05 - ව්‍යාපාර කෙරෙහි රජයේ බලපෑම ව්‍යාපාර ආචාර ධර්මවල ඇති වැදගත්කම** |

**(a)**

**Eco-Clean හි ව්‍යාපාරික පරිසරය පිළිබඳ ශඳුඅත විශ්ලේෂණය**

**ශක්තීන්**

- නව්‍ය ව්‍යාපාර ආකෘතිය
- ශක්තිමත් සන්නාම කීර්තිය
- ව්‍යාපාර පිළිබඳ මාලිකාගේ දැනුම
- උපකාරක හවුල්කාරිත්වයන්
- වර්ධනය වන වෙළෙඳපොළ සඳහා සැපයුම් කිරීම

**දුර්වලතා**

- සේවක පිරිවැටුම
- විශේෂිත සැපයුම්කරුවන් මත යැපීම (පරිසර හිතකාමී නිෂ්පාදන සැපයුම්කරුවන් මත යැපීම)
- අතෘප්තිමත් පාරිභෝගිකයින්
- සීමිත සම්පත්

**අවස්ථා**

- පුළුල් කළ වෙළඳපොළ / වෙළඳපොළ වර්ධනය
- තාක්ෂණික දියුණුව
- රජයේ ආධාරක ප්‍රතිපත්ති
- තිරසර පැතිකඩ කෙරෙහි අවධානය යොමු කිරීම

**තර්ජන**

- අහිතකර ආර්ථික තත්ත්වයන්
- විශ්වාස කළ නොහැකි සැපයුම්කරුවන්
- තරඟකාරීත්වය වැඩි වීම

***(ලකුණු 06 යි)***

aat SRI LANKA

**(b) පහත සඳහන් ඕනෑම හතරක් සඳහන් කිරීමෙන් සම්පූර්ණ ලකුණු ලබා ගත හැකිය.**

- ගනුදෙනුකරුවන්/පාරිභෝගිකයින්
- සේවකයින්
- සැපයුම්කරුවන්
- රජයේ/නියාමන අධිකාරීන්
- තරඟකරුවන්
- සමාජය
- ණය දෙන්නන්
- බැංකු
- අයිතිකරුවන්

***(ලකුණු 02 යි)***

**(c) පහත සඳහන් ඕනෑම සේවා හතරක් සඳහන් කිරීමෙන් සම්පූර්ණ ලකුණු ලබා ගත හැකිය.**

- ගෙවීම් සැකසුම් සේවා
- මුදල් කළමනාකරණ සේවා
- විදේශ විනිමය සේවා
- පුද්ගලයන්ගේ සහ ව්‍යාපාරවල වටිනා භාණ්ඩ සහ වැදගත් ලිපි ලේඛන ආරක්ෂා කිරීම සඳහා සුරක්ෂිතාගාර නඩත්තු කිරීම
- ස්ථාවර නියෝග ඉටු කිරීම
- ජංගම ගිණුම්, ඉතුරුම් ගිණුම් සහ ස්ථාවර තැන්පතුවල තැන්පතු භාර ගැනීම
- ප්‍රේෂණ
- ණයවර ලිපි නිකුත් කිරීම
- ලීසිං සේවා
- උපුටා ගත් සමාගම්වල කොටස් නිකුතු කළමනාකරණය
- බැංකු ඇපකර සැපයීම
- ක්‍රෙඩිට් කාඩ්, ඩෙබිට් කාඩ් සහ ස්මාර්ට් කාඩ් වැනි විද්‍යුත් මුදල් නිකුත් කිරීම
- මූල්‍ය උපදේශන සේවා සැපයීම

***(ලකුණු 04 යි)***

**(d)**

**1 අවදානම් අවම කිරීම:**

දේපල හානි, අනතුරු හෝ වගකීම් හිමිකම් වැනි විය හැකි අවදානම්වලින් රක්ෂණය Eco-Clean ආරක්ෂා කරයි, දැඩි මූල්‍ය අලාභයකින් තොරව අනපේක්ෂිත සිදුවීම්වලින් ව්‍යාපාරයට යථා තත්ත්වයට පත් විය හැකි බව සහතික කරයි.

aat SRI LANKA

**2 අනුකූලතාව සහ විශ්වසනීයත්වය:**

සුදුසු රක්ෂණ ආවරණයක් තිබීම ගනුදෙනුකරුවන් සහ හවුල්කරුවන් සමඟ Eco-Clean හි විශ්වසනීයත්වය වැඩි කරයි, ව්‍යාපාරය හදිසි අවස්ථා සඳහා සූදානම් වී ඇති අතර නීතිමය අවශ්‍යතාවලට අනුකූල වේ.

**3 ව්‍යාපාර දායකත්වය:**

ඕනෑම ව්‍යාපාරයක, විශේෂයෙන්ම ඕනෑම හවුල්කරුවෙකුගේ මරණයේදී නතර විය හැක. සහකරු මියයන විට රක්ෂණ ඔප්පු මගින් ප්‍රමාණවත් අරමුදල් සපයයි. දේපල රක්ෂණයේ ආධාරයෙන්, ව්‍යාපාරය ව්‍යසනයෙන්, දැවැන්ත නාස්තියෙන් හෝ අලාභයෙන් ආරක්ෂා වේ.

**4 සේවක සුබසාධනය:**

සේවකයන්ගේ සුබසාධනය සේවායෝජකයාගේ වගකීමකි. සේවක සේවිකාවන්ට රක්‍ෂණ පහසුකම් ලබාදීමෙන් ඔවුන්ගේ සුබසාධන පහසුකම් වැඩි දියුණු වේ. එය වැඩ සඳහා පෙළඹවීම වැඩි කිරීමට හේතු වේ.

**5 ණය ඉදිරි දැක්ම වැඩිදියුණු කිරීම:**

ව්‍යාපාරයට ණය සඳහා ඇපකරයක් ලෙස ප්‍රතිපත්ති ඇපකර ණයක් ලබා ගත හැක. රක්ෂිත පුද්ගලයන්ට ඔවුන්ගේ මරණයේදී ඇති සහතිකය නිසා වැඩි ණයක් ලැබේ.

***(ලකුණු 04 යි)***

**(d)** Eco-Clean ශ්‍රී ලංකාවේ වඩාත් තිරසර අනාගතයකට දායක වන ආකාරය

- **පරිසර හිතකාමී පිළිවෙත් ප්‍රවර්ධනය කිරීම -** Eco-Clean සිය ගනුදෙනුකරුවන් සහ පුළුල් ප්‍රජාව අතර තිරසර භාවිතයන් පිළිබඳව දැනුවත් කිරීම, එදිනෙදා ජීවිතයේදී පරිසර හිතකාමී නිෂ්පාදන සහ ක්‍රමවේද අනුගමනය කිරීම දිරිමත් කරයි.

- **හරිත මුලපිරීම්වලට සහය වීම -** හරිත ගොඩනැඟිලි මුලපිරීම් සහ අනෙකුත් පාරිසරික වැඩසටහන් සමඟ හවුල් වීමෙන්, Eco-Clean ශ්‍රී ලංකාව තුළ පුළුල් තිරසර ප්‍රයත්නයන් සඳහා දායක වන අතර, වඩාත් පරිසර හිතකාමී සමාජයක් කරා පද්ධතිමය වෙනසක් ඇති කිරීමට උපකාරී වේ.

***(ලකුණු 04 යි)***

***(මුළු ලකුණු 20 යි)***

***C කොටසෙහි අවසානය***

aat SRI LANKA

## *Notice:*

These answers compiled and issued by the Education and Training Division of AAT Sri Lanka constitute part and parcel of study material for AAT students.

These should be understood as Suggested Answers to questions set at AAT Examinations and should not be construed as the "Only" answers, or, for that matter even as "Model Answers". The fundamental objective of this publication is to add completeness to its series of study texts, design especially for the benefit of those students who are engaged in self-studies. These are intended to assist them with the exploration of the relevant subject matter and further enhance their understanding as well and stay relevant in the art of answering questions at examination level.

*© 2021 by the Association of Accounting Technicians of Sri Lanka (AAT Sri Lanka). All rights reserved. No part of this document may be reproduced or transmitted in any form or by any means, electronic, mechanical, photocopying, recording or otherwise without prior written permission of the Association of Accounting Technicians of Sri Lanka (AAT Sri Lanka)*